WCIC
Women's Chamber of Industry and Commerce
Engage - Empower - Enrich

In Collaboration with

USAID
FROM THE AMERICAN PEOPLE

WCIC
ප්‍රතිභාභිෂේක
Women Entrepreneur Awards 2024
බල ගැන්වීම, AIA INSURANCE

# මාර්ගෝපදේශ සහ ඇතුල්වීමේ අයදුම්පත්‍රය

WWW.WCICSL.LK

WCIC
Women's Chamber of Industry and Commerce
Engage - Empower - Enrich

In Collaboration with

USAID
FROM THE AMERICAN PEOPLE

WCIC ප්‍රතිභාභිෂේක
Women Entrepreneur Awards 2024
බල ගැන්වීම, AIA INSURANCE

# WCIC ප්‍රතිභාභිෂේක කාන්තා ව්‍යවසායක සම්මාන උළෙල 2024

WCIC
Women's Chamber of Industry and Commerce
Engage - Empower - Enrich

WCIC
ප්‍රතිභාභිෂේක
Women Entrepreneur Awards 2024
බල ගැන්වීම, AIA INSURANCE

කාන්තා කර්මාන්ත වාණිජ මණ්ඩලය විසින් 'ප්‍රතිභාභිෂේක කාන්තා ව්‍යවසායක සම්මාන උළෙල 2024' සංවිධානය කරනු ලබයි. මෙහි මූලික අරමුණ වන්නේ කාන්තා ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය, දිරිමත් කිරීම සහ කාන්තා ව්‍යවසායකත්වය අගය කරමින් ඔවුන් ව්‍යවසායකයන් ලෙස සමාජය තුළ ඔසවා තැබීම වේ.

**අපේ දැක්ම**

කාන්තාවන් වෙනුවෙන් හඬක් හා වේදිකාවක් වෙමින්, ඔවුන් බලගන්වමින් ශක්තිමත් දේශයක් ගොඩනැංවීමට හා ආර්ථික සංවර්ධනය සඳහා කාන්තාවන්ගේ ඉහළ දායකත්වයක් ලබාදීම.

**අපගේ මෙහෙවර**

ශ්‍රී ලාංකීය කාන්තාවන්ගේ අනාගත අභිවෘද්ධිය සඳහා:

- ව්‍යාපාරික හා වෘත්තීයමය සංවර්ධනය සඳහා අවස්ථාවන් සැලසීම
- අර්ථවත් සම්බන්ධතා ඇතිකිරීම
- ඔවුන්ගේ ව්‍යවසායකත්වය සහ වෘත්තීය කුසලතා ඔප්නැංවීමට අවශ්‍ය පසුබිම සැකසීම හා ඔවුන් බලගැන්වීම
- මණ්ඩලයේ සාමාජිකාවන්ගේ සාර්ථකත්වය උදෙසා පහසුකම් සැපයීම

අපගේ උපාය මාර්ගික දිශානතියට අනුකූලව, ව්‍යාපාරික කාන්තාවන් සඳහා වන ජාතික මණ්ඩලය ලෙස, කාන්තා කර්මාන්ත හා වාණිජ මණ්ඩලය විසින් WCIC ප්‍රතිභාභිෂේකා - කාන්තා ව්‍යවසායක සම්මාන 2024 පවත්වනු ලබන අතර, කාන්තා ව්‍යවසායකයින්ට ඔවුන්ගේ ව්‍යාපාර ප්‍රදර්ශනය කිරීමට නැවත වරක් අවස්ථාව උදා වේ.

වැඩි විස්තර සහ මඟ පෙන්වීම සඳහා කාන්තා කර්මාන්ත හා වාණිජ මණ්ඩලය සමඟ සම්බන්ධ වන්න.

ශ්‍රී ලංකා කාන්තා කර්මාන්ත හා වාණිජ මණ්ඩලය
380/110, සරණ පාර, පිටත බෞද්ධාලෝක මාවත
කොළඹ 07, ශ්‍රී ලංකාව

දුරකථන: +94 11 2 671 762, +94 766 848 080

ඊ-මේල්: wcicsl1@sltnet.lk, wcicsrilanka@gmail.com

WCIC
Women's Chamber of Industry and Commerce
Engage - Empower - Enrich

WCIC ප්‍රතිභාභිෂේක
Women Entrepreneur Awards 2024
බල ගැන්වීම, AIA INSURANCE

## WCIC ප්‍රතිභාභිෂේක කාන්තා ව්‍යවසායක සම්මාන උළෙල 2023


අරමුණ 04

සුදුසුකම් 04

කාර්ය සාධන ඇගයීමේ කාලය සහ අත්‍යවශ්‍ය ලියකියවිලි 05

"මගේ කතාව" 05

මූල්‍ය හා පරිපාලනය 06

සම්මුඛ පරීක්ෂණය 07

සම්මාන කාණ්ඩ සහ අර්ථ දැක්වීම 08

පළාත්බද සම්මාන 09

විශේෂ සම්මාන 10

සම්මාන සඳහා අයදුම් කිරීම 11

අයදුම් කිරීමේ උපදෙස් මාලාව සහ ගාස්තු 12 - 16

## අරමුණු

- කාන්තා ව්‍යවසායක සම්මාන මඟින් ශ්‍රී ලාංකීය ව්‍යවසායිකාවන් මෙවැනි අභියෝගාත්මක කාල පරිච්ඡේදයකදී තමන්ට හැකි පමණින් වර්ධනය වෙමින් සමාජයට හා රටේ ආර්ථිකයට කරනු ලබන ධනාත්මක බලපෑම ගෞරවයට හා ඇගයීමට ලක්කරනු ලබයි.

- ශ්‍රී ලාංකීය දැයට සහ කාන්තා ව්‍යාපාරික ප්‍රජාවට උත්තේජකයක් ලෙස ක්‍රියා කරමින් අන් අයට ඔවුන් අනුගමනය කළ හැකි ආකාරයට තම ව්‍යාපාර වැඩි දියුණු කිරීමට හා වෙළෙඳපොළ ප්‍රවේශය ලබා ගැනීමට වඩාත් හොඳ ක්‍රමවේදයන් භාවිත කරන කාන්තාවන් මෙහිදී ඇගයීමට ලක් කරනු ලබයි.

- සාර්ථක/අසාර්ථක අයදුම්කරුවන්ට තමන්ගේ ව්‍යාපාර වැඩිදියුණු කර ගැනීම සඳහා ඵලදායි උපදේශන සැපයීම.

## සුදුසුකම්

- ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලද ව්‍යාපාරයක 51%ට වඩා වැඩි කොටස් අයිතියක් ඇති දේශීය සහ ජාත්‍යන්තර වෙළෙඳපොළට භාණ්ඩ හා සේවා සපයන ව්‍යවසායිකාවන් විය යුතුය. (තනි පුද්ගල/හවුල් ව්‍යාපාර/සීමාසහිත පෞද්ගලික සමාගම්/පොදු සමාගම්) අපනයනයේ නියුතු ව්‍යවසායිකාවන් අයදුම් කිරීම සඳහා උනන්දු කෙරේ.
  - 51% කොටස් හිමිකාරීත්වය - ශ්‍රී ලාංකික/SAARC කාන්තාවන්
  - 100% කාන්තාවන්ගේ හිමිකාරීත්වය සතුයි. 1/3ක් සාමූහිකව ශ්‍රී ලාංකික/සාර්ක් කාන්තාවන් සතුය
  - සැලකිය යුතු කළමනාකරණ පාලනයක් (සභාපති/අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී/කළමනාකරණ අධ්‍යක්ෂ) ඇති ශ්‍රී ලාංකික/සාර්ක් කාන්තාවන්ට 1/3 හිමි.
  - වසර 5ක් පුරා ක්‍රියාත්මක වන නිසි පරිදි ලියාපදිංචි වූ හොඳින් ස්ථාපිත ව්‍යාපාරයක් සහිත ඉහත සඳහන් ඕනෑම ජාතික නොවන (ශ්‍රී ලංකාවේ පදිංචි/ද්විත්ව පුරවැසි) අනුකූලවීම සුදුසුකම් ලබයි.

- ලියාපදිංචි නොවූ ආයතනවල ව්‍යවසායිකාවන් මේ සඳහා සුදුසුකම් නොලබනු ඇත.

- ව්‍යාපාරයක නිෂ්පාදන, සේවා සම්බන්ධයෙන් තහවුරු කිරීම සඳහා විගණකාධිපතිවරුන් විසින් සහතික කරන ලද සාක්ෂි අවශ්‍ය වේ. (ආරම්භක සහ ක්ෂුද්‍ර භාණ්ඩ සඳහා අනිවාර්ය නොවේ)

- ප්‍රතිසංස්කරණය කරන ලද අයදුම් කිරීමේ ක්‍රියාවලිය සරල නමුත් අදාළ අංශයන්හි තොරතුරු නිවැරදිව ආවරණය නොවන්නේ නම් ඔබේ අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

**කාර්ය සාධන ඇගයීමේ කාලය සහ අත්‍යවශ්‍ය ලියකියවිලි**

මෙම සම්මාන සඳහා කාල සීමාව 2023/2024 මූල්‍ය වර්ෂය ආවරණය කරයි.
කෙසේ වෙතත් දත්ත සැපයීමේදී අවම වශයෙන් වසර දෙකක (හෝ පහක් දක්වා) අතීත කාර්ය සාධනය අපේක්ෂා කෙරේ.

1. "මගේ කතාව"
2. මූල්‍ය සහ පරිපාලනය
3. විනිශ්චය මණ්ඩලය හා පවත්වන සම්මුඛ සාකච්ඡාව (සුදුසුකම් ලත් අයදුම්කරුවන්ට පමණි)

"මගේ කතාව"

අයදුම්කරුවන්ට මාර්ගෝපදේශයක් ලෙස පහත ආකෘතිය භාවිත කළ හැක. සෑම කොටසක්ම උපරිම වශයෙන් වචන 200ක් විය යුතුය. (වචන 200ට වඩා වැඩි අයදුම්පත් ප්‍රතික්ෂේප විය හැක) මාගේ කතාව යටතේ සටහන් කරන ලද සියලුම ප්‍රකාශයන් විශ්වාසදායක සාක්ෂි සහිතව තහවුරු කළ යුතුය. එය සම්පූර්ණයෙන්ම සනාථ කළ හැකි අයුරින් ඔබේ ව්‍යාපාරය හා සම්බන්ධ සැබෑ ජීවිතයේ සිදුවීම් ආවරණය කළ යුතුය. එක් එක් නිර්ණායක යටතේ ගණන ලකුණු කළ යුතුය. ප්‍රදානය කරනු ලබන මුළු ලකුණු සංඛ්‍යාව 1000කි.

| නිර්ණායක | විස්තරය |
|---|---|
| අරමුණු මත පදනම් වූ ව්‍යාපාර (ලකුණු 200) | • ඔබේ ව්‍යාපාරයේ අරමුණු කුමක්ද?<br>• ඔබේ ව්‍යාපාරයේ කවර අවශ්‍යතා සපුරන්නේද? ඒ කෙසේද?<br>• ඔබේ වෙළෙඳ සන්නාමය ස්ථානගත කර ඇත්තේ කෙසේද?<br>• ඔබ ඉලක්ක කරන පාරිභෝගිකයා කවුද?<br>• ඔබේ තරගකාරී වෙළෙඳපොළ කුමක්ද? කා සමගද? ඔබ ඊට වඩා වෙනස් වන්නේ කෙසේද? එයට හේතු මොනවාද? |
| ව්‍යවසායකත්ව දැක්ම (ලකුණු 100) | • ඔබ ඔබේ ගමන ආරම්භ කළේ කෙසේද?<br>• ඔබේ ව්‍යාපාරයේ සාර්ථකත්වය කෙසේද?<br>• ඔබ ඔබේ සේවකයන් දිරිගන්වන්නේ සහ බලගන්වන්නේ කෙසේද? ඒ බව තහවුරු කරන්නේ කෙසේද?<br>• ඔබේ ව්‍යාපාරයට අභියෝගයන් කෙසේ බලපෑවේද? (උදා: කොවිඩ් 19 වැනි තත්ත්වයන්) |
| නවෝත්පාදනය පිළිබඳව ඔබේ අවධානය (ලකුණු 200) | • ඔබගේ මීළඟ නවෝත්පාදනය කුමක්ද?<br>• ඔබගේ ආසන්නතම නවෝත්පාදනය විස්තර කරන්න<br>• ඔබේ ව්‍යාපාරය තුළ නිර්මාණශීලිත්වය රඳවාගන්නේ කෙසේද? ඒ සඳහා ඔබ උපයෝගිකරගත් විද්‍යාත්මක දත්ත කවරේද? |
| වටිනාකම් ගොඩනැගීම (ලකුණු 200) | • ඔබට සහ ඔබේ සාමාජිකයන්ට වටිනාකමක් ඇති කරන්නේ කෙසේද?<br>• ඔබ ඔබේ කොටස්කරුවන්ට වටිනාකමක් එක් කරන්නේ කෙසේද?<br>• ඔබේ කණ්ඩායම වර්ධනය කරමින් රඳවාගැනීමට ඔබ කරන ආයෝජන මොනවාද? මේ සඳහා ඇති බාධක මොනවාද? |
| දේශීය හා ගෝලීය වෙළෙඳපොළට ඔබගේ දායකත්වය (ලකුණු 100) | • ඔබගේ වර්තමාන වෙළෙඳපොළ ආවරණය කොපමණද? (කොපමණ පාරිභෝගිකයන්ද? වටිනාකම කුමක්ද?<br>• වෙළෙඳපොළ ප්‍රවර්ධනය සඳහා ඇති සැලසුම් කවරේද? (ඇත්නම්)<br>• ඔබ අපනයනය කරනවාද? එසේ නැත්නම් ඔබ අපනයනය කිරීමෙන් වැළැකී සිටින්නේ ඇයි?<br>• එසේ නැත්නම් ඒ සඳහා පිවිසීමට සැලසුමක් තිබේද? |
| උපායමාර්ගික දිශානතිය (ලකුණු 200) | • අනාගතයේදී ඔබ ඔබේ ව්‍යාපාරය කවර තත්ත්වයකට ගෙන යාමට අදහස් කරන්නේද?<br>• ප්‍රදේශයට පිවිසීමට සැලසුම් තිබේද? එය කවදා ආරම්භ කිරීමට අදහස් කර තිබේද?<br>• ඔබට පැහැදිලි ක්‍රියා මාර්ගයක් තිබේද? ඒ සඳහා නියමිත කාල සටහනක් නිර්මාණය කර තිබේද? එය තුළ සිදුවන්නේ කවදාද? එය සිදු කරන්නේ කවුරුන් විසින්ද? |

**මූල්‍ය හා පරිපාලනය** *

පහත තොරතුරු සනාථ කිරීම සඳහා විගණකවරුන් විසින් සහතික කරන ලද සියලුම අදාළ ලියකියවිලි අවශ්‍ය වේ:

| නිර්ණායක | විස්තරය |
|---|---|
| මූල්‍ය වටිනාකම් නිර්මාණය (ලකුණු 200) | • විකුණුම් වර්ධනය YOY (වසර 5ක් හෝ අදාළ වන පරිදි)<br>• සමුච්චිත වාර්ෂික වර්ධන වේගය (අවම අවුරුදු 2, ඉතා සුදුසු අවුරුදු 5)<br>• බදු වලට පෙර ලාභය/අලාභය (අවම අවුරුදු 2)<br>• කොටස් හිමියාගේ කොටස්<br>• ආයතනයේ සේවක සංඛ්‍යාව |
| පාලනය (ලකුණු 100) | • සුදුසු පාලක මණ්ඩලයක් (Board) ස්ථාපිත කිරීම<br>• නියමිත රැස්වීම් පැවැත්වීම |
| කුසලතා සංවර්ධනය (ලකුණු 100) | • සේවක සංයුතිය - ස්ත්‍රී/පුරුෂ භාවය/වයස/සුදුසුකම් ආදිය<br>• සේවකයෙකු සඳහා වාර්ෂික පිරිවැය<br>• සේවක සංවර්ධනය සඳහා ආයෝජනය |
| පුළුල් කිරීම (ලකුණු 100) | • උපාය මාර්ගික වර්ධන සැලසුම්<br>• අපනයන විභවය |

* විගණනය කරන ලද ගිණුම් විස්තර අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය. ආරම්භක හා ක්ෂුද්‍ර ව්‍යාපාර සඳහා විගණනය කළ ගිණුම් විස්තර නොමැති නම් සුදුසුකම් ලත් ගණකාධිකාරිවරයෙකු විසින් සහතික කරන ලද ගිණුම් විස්තර ප්‍රමාණවත් වේ.

**ඉල්ලුම් පත්‍රය සමග පහත සඳහන් ලේඛන ලැයිස්තුවද ඉදිරිපත් කරන්න**

- ජාතික හැඳුනුම්පතේ හෝ විදේශ ගමන් බලපත්‍රයේ ඡායා පිටපතක්
- ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ පිටපත
- කොටස් සහතිකය/ආකෘතිය 15
- 23/24, 22/23, 21/22 සඳහා විගණනය කරන ලද ගිණුම් විස්තර පිටපත් (ආරම්භක සහ ක්ෂුද්‍ර ව්‍යාපාර සඳහා සහතික කළ ගිණුම් විස්තර)
- ඇතුල්වීමේ ගාස්තු තහවුරු කිරීම
- නිසි පරිදි පුරවන ලද අයදුම්පත
- අනන්‍යතාවය තහවුරු වන ඡායාරූපයක්
- සන්නාමයේ/සමාගමේ ලාංඡනය

**කෙටි ලැයිස්තුගත කර ඇති අය සඳහා සම්මුඛ පරීක්ෂණය**

විනිසුරුවන් විසින් පහත ක්‍රමය අනුගමනය කරනු ඇත:

| නිර්ණායක | විස්තරය |
|---|---|
| ව්‍යවසායකත්ව බලය (ලකුණු 200) | • ඇයගේ කතාව සාරාංශගතව එළිදැක්වීම<br>• ඔබේ ව්‍යාපාරය ආරම්භ කිරීමට ඔබව පෙළඹවූයේ කුමක්ද?<br>• ඔබ පිරවීමට උත්සාහ කළ වෙළෙඳපොළේ අවශ්‍යතා මොනවාද?<br>• තරගකරුවන්ගෙන් ඔබ කැපී පෙනෙන්නේ කුමක් ද? |
| පෞරුෂය (ලකුණු 100) | • පෞරුෂය සහ ඉදිරිපත් කිරීම |
| සිතීම (ලකුණු 200) | • ප්‍රශ්නවලට පැහැදිලිව සහ සාරාංශගතව පිළිතුරු දීමේ හැකියාව |
| ගෝලීය ගමන්මග (ලකුණු 250) | • ලොව පුරා වත්මන් පැවැත්ම සහ අනාගත සැලසුම් |
| ආර්ථික දායකත්වය (ලකුණු 250) | • ශ්‍රී ලංකා ආර්ථිකයට ඔබ ආයතනයෙන් එකතු වන වටිනාකම |

- අයදුම්කරුවෙකු ක්‍රියාවලියට සම්පූර්ණයෙන්ම අනුගත විය යුතුය. ඉදිරිපත් කිරීමේදී නිර්මාණශීලීත්වය සාදරයෙන් පිළිගන්නා නමුත් අවශ්‍ය සියලු තොරතුරු ග්‍රහණය කර ගත යුතුය.

- ඉදිරිපත් කරන ලද තොරතුරු සත්‍ය විය යුතු අතර ඇගයීමට ලක් කිරීම ව්‍යාපාරයට අදාළ විය යුතුය. මෙය අනුමත කිරීම විගණකවරුන් විසින් කළ යුතුය.

## සම්මාන කාණ්ඩ සහ අර්ථ දැක්වීම

| අදාළ කාණ්ඩය | විස්තරය |
|---|---|
| නව ආරම්භ | අලුතින් පිවිස - වසර 5ට නොවැඩි |
| ඉතා කුඩා පරිමාණ | වාර්ෂික ආදායම මිලියන 5ට අඩු |
| සුළු පරිමාණ | වාර්ෂික ආදායම මිලියන 5 සිට මිලියන 50 දක්වා |
| මධ්‍යම පරිමාණ | වාර්ෂික ආදායම මිලියන 51 සිට මිලියන 250 දක්වා |
| මහා පරිමාණ | වාර්ෂික ආදායම මිලියන 251ට වැඩි |
| සාක් කලාපය | කලාපීය ඉල්ලුම්කරුවන් සඳහා අපේක්ෂිත වාර්ෂික අදායම වර්ගීකරණයන්ට අනුව දළ වශයෙන්<br>සුළු පරිමාණ ව්‍යාපාර - ඇමෙරිකානු ඩොලර් (ඩොලර් 15,000 - 155,000 දක්වා)<br>මධ්‍යම පරිමාණ (ඩොලර් මිලියන 175 000 - 830 000 දක්වා)<br>මහා පරිමාණ (ඩොලර් මිලියන 830 000 වැඩි) |

* මෙහෙයුම් ආරම්භ කර වසර 5ක් ඇතුළත වුවද, අනෙකුත් කාණ්ඩවල ආදායම් අවශ්‍යතාවලට අනුකූලවන, ආරම්භකයින් අදාළ ආදායම් කාණ්ඩ යටතට යොමු විය යුතුයි.

එවැනි අයදුම්පත් Startups යටතේ ලැබුණහොත් WCIC එය අදාළ කාණ්ඩයට ගෙන යනු ඇත.

මධ්‍යම සහ විශාල කාණ්ඩවල කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන්ගේ ව්‍යාපාර ස්ථාන අධීක්ෂණයට ලක් වීමට ඉඩ ඇත.

## පළාත්බද සම්මාන

පළාත් ආවරණය වන පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්කරුවන්ට **'කලාපයේ හොඳම සම්මානය'** සඳහා ඔවුන් පදනම් වූ පළාත යටතේ තරග කිරීමට අවස්ථාව ඇති අතර, එම අයදුම්පතම ජාතික සම්මාන සඳහා සලකා බලනු ලැබේ. කලාපීය සම්මාන සඳහා වර්ගීකරණය අදාළ නොවන නමුදු ජාතික සම්මාන සඳහා බැලීමේදී එය අදාළ වේ.

| පළාත |
|---|
| බස්නාහිර |
| වයඹ |
| දකුණු |
| සබරගමුව |
| මධ්‍යම |
| ඌව |
| නැගෙනහිර |
| උතුරුමැද |
| උතුරු |



**විශේෂ සම්මාන**

උළෙලේ විශේෂයෙන්ම අවධානය යොමුකරන ප්‍රධාන අංශ දහයක් ඇති අතර, සම්මාන සඳහා තෝරාගනු ලබන්නේ, විශිෂ්ට ලකුණු සංඛ්‍යාවකට හිමිකම් කී ඉල්ලුම්කරුවන් පමණි.

| **විශේෂ සම්මාන** |
|---|
| **වසරේ හොඳම කාන්තා ව්‍යවසායිකාව - 2024** |
| සාර්ක් කලාපයේ හොඳම ව්‍යවසායිකාව - 2024 |
| වසරේ වඩාත් කැපී පෙනෙන අපනයන ව්‍යවසායිකාව (නිෂ්පාදන හා සේවා) - 2024 |
| තාක්ෂණය උපයෝගී කරගත් වසරේ හොඳම ව්‍යවසායිකාව - 2024 |
| වසරේ හොඳම නවෝත්පාදක ව්‍යවසායිකාව - 2024 |
| වසරේ තරුණ ව්‍යවසායිකාව - 2024 |
| වසරේ කැපී පෙනෙන ආරම්භක ව්‍යවසායිකාව - 2024 |
| 2023 වසරේ වැඩිම ධනාත්මක හැකියාවක් සහිත ව්‍යවසායිකාව - 2024 |
| සමාජ සේවයට කැපවුණු වසරේ හොඳම ව්‍යවසායිකාව - 2024 |

**WCIC**
Women's Chamber of Industry and Commerce
Engage - Empower - Enrich

WCIC
ප්‍රතිභාභිෂේක
Women Entrepreneur Awards 2024
බල ගැන්වීම, AIA INSURANCE

### සම්මාන සඳහා අයදුම් කිරීම

ඔබගේ ඉදිරිපත් කිරීම සඳහා පහත සඳහන් දෑ අදාළ වේ:

| | |
|---|---|
| **භාෂා** | අයදුම්පත් ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ භාෂාවෙන් ඉදිරිපත් කළ හැක |
| **අයදුම්පත** | සියලුම ආධාරක, සාක්ෂි සහිත මුද්‍රිත ලේඛනයක් මගින් ඉදිරිපත් කළ හැක.<br>සම්මුඛ පරීක්ෂණය අතරතුර භෞතික ලේඛන ඉදිරිපත් කළ යුතුය. |

### අයදුම් කිරීමේ උපදෙස් මාලාව සහ ගාස්තු

ඇතුල්වීමේ අයදුම්පත් කට්ටලය සහ මාර්ගෝපදේශ www.wcicsl.lk සභා ගර්භයේ වෙබ් අඩවියට ප්‍රවේශ වී බාගත හැකිය.

උපකාරක ලියකියවිලි සමඟ නිසි ලෙස පුරවන ලද අයදුම්පත් (ක්‍රමානුකූලව කේතනය කර ඇමුණුම් කරන්න) ස්කෑන් කර විද්‍යුත් තැපෑලෙන් එවිය හැකි අතර, එහි දෘඩ පිටපත (අයදුම්පත්‍ර සහ ලේඛන) මුද්‍රා තැබූ කවරයක් තුළ බහා කළමනාකාර අධ්‍යක්ෂක, කාන්තා කර්මාන්ත හා වාණිජ මණ්ඩලය, 380/110, සරණ පාර, කොළඹට භාර දිය යුතුය. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2024 ඔක්තෝබර් 31. සම්මාන උළෙල 2025 ජනවාරි මාසයේදී පැවැත්වේ. සටහන: ඉදිරිපත් කරන දිනය මාර්ගගත අයදුම්පත ඉදිරිපත් කළ දිනය ලෙස සලකනු ලබන අතර නියමිත අයදුම්පත් ඉදිරිපත් කිරීමේ කාලසීමාවන්ට අනුකූලව ගෙවීම් කුවිතාන්සිය සමඟ නිසි පරිදි පුරවන ලද අයදුම්පතේ දෘඪ පිටපත වාණිජ මණ්ඩලය වෙත භාර දිය යුතුය.

| අදාළ අංශ | මණ්ඩල සාමාජික | සාමාජික නොවන |
|---|---|---|
| නව ආරම්භ | රු. 1,000/- | රු. 1,500/- |
| සුළු පරිමාණ | රු. 1,000/- | රු. 1,500/- |
| කුඩා පරිමාණ | රු. 3,000/- | රු. 4,000/- |
| මධ්‍යම පරිමාණ | රු. 7,500/- | රු. 8,500/- |
| මහා පරිමාණ | රු. 10,000/- | රු. 12,500/- |
| සාක් කලාපය | | $ 50 |

ගෙවීම් කළ හැක්කේ මුදලින් හෝ 'Women's Chamber of Industry & Commerce' නමින් රේඛනය කළ චෙක්පත් මඟින් පමණි. ඇතුළත්වීමේ ගාස්තුව ආපසු නොගෙවනු ලබයි. "අදායකයාගේ ගිණුමට පමණි" ක්‍රමය යටතේ ගෙවීම් කළහැකි අතර Online Transfers ගෙවීම් ලදුපත අයදුම්පත සමඟ අමුණා තිබිය යුතුය.

**ගිණුම් හිමියාගේ නම: Women's Chamber of Industry and Commerce**
**ගිණුම් අංකය: 055010125721**
**බැංකුවේ නම: හැටන් නැෂනල් බැංකුව**
**ශාඛාව: බොරැල්ල**

වැඩි විස්තර සඳහා, කරුණාකර මණ්ඩලයේ ලේකම් හෝ ප්‍රධාන විධායක නිලධාරි හා සම්බන්ධ වන්න. ඒ සඳහා 0112671762 අමතන්න, නැතිනම් wcicsl1@sltnet.lk වෙත හෝ wcicsrilanka@gmail.com වෙත ඊ-තැපැලෙන් යොමුවන්න.

# පළමුවෙනි කොටස 01

WCIC
Women's Chamber of Industry and Commerce
Engage - Empower - Enrich

WCIC ප්‍රතිභාභිෂේක
Women Entrepreneur Awards 2024
බල ගැන්වීම, AIA INSURANCE

## පෞද්ගලික තොරතුරු

ව්‍යවසායිකාවගේ නම/තනතුර :

ජා.හැ.අ. / ගමන් බලපත් අංකය(SARC) :

විදේශ ගමන් බලපත්‍ර ඡායාරූපයේ ප්‍රමාණය :

වයස/උපන් දිනය :

අයදුම්කරුගේ විස්තර:

ස්ථාවර දුරකථන අංකය :

ජංගම දුරකථන අංකය :

ඊ-මේල් :

ආයතනයේ වෙනත් නියෝජිතයකුගේ විස්තර:

නියෝජිතයන් - නම සහ සම්බන්ධතා අංකය:

අයදුම්කරුගේ අත්සන

ආයතනයේ දරණ තනතුර :

* ඉදිරිපත් කළ ලේඛන ලැයිස්තුවක් අමුණන්න

## අනෙකුත් තොරතුරු

ව්‍යාපාරයේ නම :

ව්‍යාපාර ලිපිනය :

ව්‍යාපාරය ලියාපදිංචි අංකය (ව්‍යපාරාය ස්ථාපිත කළ වර්ෂය, අදාළ පිටපත අමුණන්න) :

වත්මන් කොටස් හිමිකම පිළිබඳ විස්තර: (පෝරම අංක 15/කොටස් සහතිකය)

නිෂ්පාදන තොරතුරු ඉල්ලුම්පතට අදාළව භාණ්ඩ හා සේවාවන්ගේ තොරතුරු :

අදාළ කාණ්ඩය : නව ආරම්භය/ ක්ෂුද්‍ර පරිමාණ/ කුඩා පරිමාණ/ මධ්‍යම පරිමාණ/ මහා පරිමාණ සාක් කලාපය මධ්‍යම පරිමාණ/ මහා පරිමාණ

Social Media links : Website ____ Facebook ____

Instagram ____ LinkedIn ____

කරුණාකර ව්‍යාපාරික ලාංඡනය සහ සන්නාම ලාංඡනය අමුණන්න :

ඔබ තාක්ෂණික ව්‍යවසායකයෙක්ද? ඔව් නම්, ඔබ වෙළඳපොළට හඳුන්වා දී ඇති ඩිජිටල් නිෂ්පාදන/විසඳුම් මොනවාද? : (ඔබට විස්තර වෙන වෙනම ඇමිණිය හැක)

ඔබ සමාජ ව්‍යවසායකයෙක්ද? ඔව් නම්, ඔබ සහයෝගය දී ඇති හේතුව සහ වැඩි සමාජ යහපතක් උදෙසා නිර්මාණය කර ඇති බලපෑම කුමක්ද? : (ඔබට විස්තර වෙන වෙනම ඇමිණිය හැක)

# දෙවෙනි කොටස 01

## "මගේ කතාව" (ලකුණු 1000)

මෙම කොටස පිරවීමේ දී අයදුම් කිරීමේ උපදෙස් මාලාවේ ඇති අකෘතිය කියවා සම්පූර්ණ කිරීමට උත්සුක වන්න

| **නිර්ණායක (ලකුණු 1000)** | **උපරිම වචන 200කට නොවැඩි වන සේ සෑම කොටසක්ම සම්පූර්ණ විය යුතුය** | **ඇමුණුම් යොමුව හා පිටු අංකය** |
|---|---|---|
| අරමුණ මත පදනම් වූ ව්‍යාපාර (ලකුණු 200) | | |
| ව්‍යවසායකත්ව දැක්ම (ලකුණු 100) | | |
| නවෝත්පාදනය පිළිබඳව ඇති අවධානය (ලකුණු 200) | | |
| වටිනාකම ගොඩනැඟීම (ලකුණු 200) | | |

WCIC
Women's Chamber of Industry and Commerce
Engage - Empower - Enrich

WCIC
ප්‍රතිභාභිෂේක
Women Entrepreneur Awards 2024
බල ගැන්වීම, AIA INSURANCE

| නිර්ණායකය | විස්තර | ඇමුණුම් යොමුව හා පිටු අංකය |
|---|---|---|
| දේශීය හා ගෝලීය වෙළෙඳපොළට ඔබගේ දායකත්වය (ලකුණු 100) | | |
| උපායමාර්ගික දිශානතිය (ලකුණු 200) | | |

WCIC
Women's Chamber of Industry and Commerce
Engage - Empower - Enrich

WCIC ප්‍රතිභාභිෂේක
Women Entrepreneur Awards 2024
බල ගැන්වීම, AIA INSURANCE

## මූල්‍ය හා පරිපාලනය (ලකුණු 500)

**ව්‍යාපාරයේ භූගෝලීය පැවැත්ම**

☐ බස්නාහිර පළාත ☐ වයඹ පළාත ☐ දකුණු පළාත
☐ සබරගමුව පළාත ☐ මධ්‍යම පළාත ☐ ඌව පළාත
☐ නැගෙනහිර පළාත ☐ උතුරුමැද පළාත ☐ උතුරු පළාත

**සාක් අයදුම්කරුවන් සඳහා - රට** ........................ **නගරය** ........................

**වසර තුනක විගණනය කරන ලද මූල්‍ය තොරතුරු**

☐ 2021/2022 ☐ 2022/2023 ☐ 2023/2024

**එක් එක් වර්ෂ අවසානයේ සම්පූර්ණ සේවකයින් ගණන**

| 2021/2022 | 2022/2023 | 2023/2024 |
|---|---|---|
| | | |

**සේවක සම්මිශ්‍රණය පිළිබඳ සාරාංශයක් ස්ත්‍රී/පුරුෂ භාවය/ වයස/සුදුසුකම් ආදිය**

**සේවක සංවර්ධනය සඳහා කල ආයෝජනය හා සේවක පිරිවැය පිළිබඳ විස්තර**

**පරිපාලන ව්‍යුහය**
අධ්‍යක්ෂ මණ්ඩල තොරතුරු (අවම වශයෙන් වසරකට රැස්වීම්/හමුවීම් කොපමණ සැලසුම් කරනවාද) හෝ පරිපාලනය මනාව සිදුවේදැයි සොයා බැලීම සඳහා වෙනත් කමිටුවක් පත්කර තිබේද?

**මතු සැලසුම් උපාය මාර්ගිකව සාධාරණීයකරණය කරමින් ඉදිරියට යන අයුරු**

තොරතුරු සැපයීම සඳහා කරුණාකර අයදුම් කිරීමේ උපදෙස් මාලාව ඉවහල් කරගන්න.
තම අයදුම්පතේ උපදෙස් අනුගමනය කර ඇත්දැයි සුපරීක්ෂාකාරීවන්න.

| **නිර්ණායකය** | **සවිස්තරාත්මක තොරතුරු** | **යොමුව සහ පිටු අංකය, ඇමුණුම** |
|---|---|---|
| මූල්‍ය වටිනාකමේ වර්ධනය (ලකුණු 200) | | |
| පරිපාලනය (ලකුණු 100) | | |
| හැකියා වර්ධනය (ලකුණු 100) | | |
| පුළුල්කරණය (ලකුණු 100) | | |

ස්තූතියි!

# අනුග්‍රහය

## ප්ලැටිනම්

## ඩයමන්ඩ්

## සහයෝගිතා අනුග්‍රහය

## රන්

## රිදී

## ලෝකඩ

## මාධ්‍ය අනුග්‍රහ - මුද්‍රණ / සමාජ මාධ්‍ය

## නිල ඉලෙක්ට්‍රොනික මාධ්‍ය අනුග්‍රහය

## බුද්ධිමය අනුග්‍රහය

## සන්නිවේදන අනුග්‍රහය

WCIC
Women's Chamber of Industry and Commerce
Engage - Empower - Enrich

WCIC
ප්‍රතිභාභිෂේක
Women Entrepreneur Awards 2024
බල ගැන්වීම, AIA INSURANCE

**ශ්‍රී ලංකා කාන්තා කර්මාන්ත හා වාණිජ මණ්ඩලය**
380/110, සරණ පාර, පිටත බෞද්ධාලෝක මාවත
කොළඹ 07, ශ්‍රී ලංකාව